මී මැස්සන්ගේ හැසිරීම ජීව විද්‍යාත්මකව චිරස්ථායිවූයේ හැසිරීම කලානුරූපීව හෝ අවස්ථානුරූපීව වෙනස් නොවන නිසාය. නමුත් මිනිසුන්ගේ තත්වය මීට වඩා වෙනස්ය. ඕනෑම කුඩා ළමයෙකු (අංගවිකල නොවූ) උපදින්නේ සමාජයකට අනුරූපවන ආකාරයට හැසිරීමට හැකියාව සහිතව. ඒ අනුව ඔහු සිංහලයෙකු, ද්‍රවිඩයකු හෝ චීන ජාතිකයෙකු ආදී වශයෙන් විය හැකිය. මේ අනුව අපට මානව සමාජ සංවිධානය පවත්වාගෙන යාම මේ අනුව අපට මානව සමාජ සංවිධානය පවත්වාගෙන යාම ''ආරය" පිළිබඳ පූර්ව නිගමනයක් පදනම් කොටගත් හැසිරීම් මත් සිදුනොවන බව පෙනේ. සාමාජික ගතිසිරිත්, චර්යා, ආදිය ඉගෙන ගැනීමට පදනම් වන අවිඥානක හෝ සවිඥානක අත්දැකීම් නැතහොත් තමා බිහිවූ සමාජය දීර්ඝ කාලයක් තිස්සේ පවත්වාගෙන එනු ලබන වටිනාකම් පද්ධතිය අනුව හැඩගැස්වීමේ නැතහොත් ඒ අනුව සකස්වීමේ ක්‍රියාවලිය සමාජානුයෝගයයි. අලුත් උපන් ළදරුවකු ඔහු උපන් සමාජයේ සංස්කෘතිය, සිරිත් විරිත් ආදිය එකවර ඉගෙනිය නොහැකිය. ඔහුගේ ජීවිතය රඳාපවතින්නේ ඉගෙනීම් හා සම්බන්ධ අත්දැකීම් මතය. සමාජය පිලිගත් හැසිරීම් තුලින් ඔහුගේ හැසිරීම් සංවිධානය කරගනු ලබයි. සරළව පැවසුවහොත් අධ්‍යාපනය මගින් මෙන්ම සමාජානුයෝජනය මගින්ද සිදුවන්නේ එකම ක්‍රියාවලියයි. පුද්ගලයෙකුගේ හැසිරීම් පාලනයක්, ඇති කිරීම සමාජානුයෝජනය මගින් සිදුවේ.

ප්‍රකට සමාජවිද්‍යාඥයන් කීපදෙනෙක් සමාජානුයෝජනය මෙසේ විස්තර කරයි. එෆ් එලකින් ගේ විග්‍රහයට අනුව ''යමකු තම සමාජය හෝ සමාජ සමූහය විසින් අනුමත කරන ලද ජීවන මාර්ග පිළිබඳ ඉගෙනීමක් ගොඩනගා ගනිමින් ඔහු ඒ තුල ක්‍රියාකාරීවීම සමාජානුයෝජනය ක්‍රියාවලිය ලෙස හඳුනවයි. ටැල්කොම් පාසන්ස් නම් සමාජවිද්‍යාඥයා -සමාජයේ බලපවත්වන යම් යම් සාරධර්ම ආකල්ප පිළිබඳ ඉගෙන ඒවා තමාගේ චරිතය තුලට අභ්‍යන්තරීකරණය කරගැනීම" ලෙස සමාජානුයෝජනය විග්‍රහ කරයි. සමාජ මනෝවිද්‍යාඥයකු වන -ජෝජ් හර්බට් මීඩ්" "දෙමාපියන් පිලිගත් ධර්මතාවන් දරුවන් විසින් අභ්‍යන්තරීකරනය කරගෙන හොඳ සුපහන් සිතක් තනා ගැනීමේ ක්‍රියාවලිය" සමාජානුයෝජනය ලෙස දක්වයි.

සමාජානුයෝජනය තුලින් ඕනෑම සමාජයක්



## සමාජානුයෝජනයේදී පවුල සතු කාර්ය සමුදාය

අපේක්ෂා කරන අරමුණු කිහිපයක් වේ.

(i) සංස්කෘතිය අවබෝධ කර ගැනීම මෙමගින් තමා උපන් සමාජයේ සිරිත් විරිත් කලා ශිල්ප ඇදහිලි, නීතිරීති, භාෂාව ආදී පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට.

(ii) මහා පෞරුෂයක් ගොඩ නැගීමට.

(iii) තමාතුල ආත්ම සංවර්ධනයක් ගොඩනගා ගැනීම.

(iv) දඬුවම හා ප්‍රශංසාව පිළිබඳ අවබෝධයක් ලබාගැනීම.

සමාජයක ජීවත්වන පුද්ගලයින් එකට එකතුවී වාසය කරන කුඩාම ඥාතීත්වය ඒකකය පවුලයි. පවුල් මගින් සමාජයට නව සමාජයට නව සමාජිකයන් නැතිනම් තම දරුවන් සමාජයට නව සමාජිකයන් එකතු කරයි. එපමණක් නොවේ... ඒ අළුත් සාමාජිකයන් නැතිනම් තම දරුවන් සමාජයට ගැලපෙන එමෙන් ම ප්‍රයෝජනවත් ආකාරයට මෙහෙයවන්නේ ''පවුල" නමැති සමාජ ආයතනය මගිනි.

පුද්ගලයා සමාජය පිළිබඳව මුල් ම පාඩම ඉගෙන ගන්නේ -පවුල" නැමැති මුල්ම ආයතනය මගිනි. එය ප්‍රාථමික සමාජානුයෝජනය සිදුවන ආයතනය ලෙසද හැඳින්වේ. ද්විතීක සමාජානුයෝජනය සිදුවන ආයතන ලෙස පාසැල මිතුරු සමූහ, උපසංස්කෘති ආදිය දැක්විය හැකිය.

ඕනෑම සමාජයක පවතින සිරිත් විරිත් නීතී රීති සමාජය ඇගයීම් නව සමාජිකයාට හුරුකරන්නේ පවුල තුල මව පියා සහෝදර සහෝදරියන් සහ වැඩිහිටියන් මගිනි. කායික අවශ්‍යතා මෙන් ම මානසික අවශ්‍යතා සම්පූර්ණ කරගන්නා දරුවා ඒ සඳහා දෙමාපියන් සහ දරුවන් අතර චිත්තවේගීය බැඳීමක් එම ක්‍රියාවලිය උපයෝගී කරගනී. පුද්ගලයෙකුගේ පෞරුෂත්ව වර්ධනය සඳහා මේ ප්‍රාථමික සමාජානුයෝජනය අවධිය ඉතා වැදගත්ය. එම නිසා -පවුල" මගින් ඉටුවන මෙම කාර්යය වෙනත් කිසිඳු සමාජ ආයතනයකට සම්පූර්ණ කල නොහැකි බව අද සමාජවිද්‍යාඥයින්ගේ මතයයි.

සුප්‍රකට සමාජමනෝවිද්‍යාඥයකු වන -ජොන් බෝල්ඩ්" බිළිඳු අවධියේ මව සහ දරුවා අතර සම්බන්ධතාවයේ වැදගත්කම පෙන්වා දෙයි. කුඩා අවධියේ මවගේ සෙනෙහස නොලැබූවිට -මාතෘවිහීනතාව" නම් සංකල්පය නිසා දරුවකු මහාසමාජයට එකතුවන්නේ අඩුපාඩු සහිත පෞරුශයක් ඇතිවන බව -බෝල්බි" පෙන්වා දෙයි. එසේ ම පියාගේ අභාෂය ආදර්ශය, ආදරය කරුණාව ද දරුවකුට ඉතාවැදගත් වේ. පියකුගේ සෙනෙහස රැකවරණය නොලැබූ දරුවකු තුල ද අඩුපහසුකම් සහිත පෞරුෂ ලක්ෂණයක් දැකිය හැකිය. සමාජ විද්‍යාවේදී මෙය භින්න පෞරුෂ ලක්ෂණ ලෙස හඳුන්වයි

වශයෙන් පරිපූර්ණ තත්වයකට ලක්කරයි. න්‍යෂ්ටික පවුල තුල බොහෝවිට දරුවකු මෙහෙකරුවකු සමග ඔහුගේ ළමා කාලය ගත කිරීමට අද සිදුවී තිබේ. නැතිනම් දිවාසුරැකුම් මධ්‍යස්ථානයක දරුවාට වැඩිකාලයක් ගතකිරීමට සිදු වී තිබේ. මේ නිසා බොහෝ විට මහා පෞරුෂයක් දරුවා තුල ගොඩනගා ගැනීමට බාදාවක් වී තිබේ.

මේ අනුව අපට -සමාජානුයෝජනය" යනු සමාජයක පැවැත්ම අඛණ්ඩව පවත්වා ගැනීමට සමාජය යම් පාලනයකට ලක් කරන ක්‍රියාවලියක්

පුෂ්පිකා ගමගේ
රොක්ස්බර්ග් පාක්

ලෙස දැක්විය හැකිය. මේ ක්‍රියාවලියට පටහැනිව සමාජයක ඕනෑම සාමාජිකයෙකු තම සාමාජිකයන් නොපිළිගන්නා තත්වයක් දැකිය හැකිය. සමාජයක සුවිශේෂ වූ සංස්කෘතික ලක්ෂණ පවරාදීමත්, නව සාමාජිකයාට කායික අවශ්‍යතා සහ මානසික අවශ්‍යතාවයන් වන චිත්තවේගීය බැඳීම, ආදරය, ආරක්ෂාව ලබාදීමත් මේ ක්‍රියාවලිය තුලින් සිදුවේ.

සමාජානුයෝජනයේදී උපකාරීවන මුල්ම ආයතනය පවුලයි. නව සමාජිකයා පවුල තුල දෙමාපියන් සමග ගතකරන කාලයේදී සමාජ සම්මත චරියාවන් ගොඩනගා ගනිමින් මහා පෞරුෂයක් ගොඩනගා ගනී. සමාජ අගයන් ගැන, කතා කරන භාෂාව ආදිය පිළිබඳ අවබෝධයක් පවුල තුළින් සිදුවේ. සිහලයෙකු නම් සිංහල භාෂාව, සිරිත් විරිත්, කලාශිල්ප සමාජයේ නීතිරීති ආදිය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට මුල් වන්නේ පවුලනම් ආයතනය මගිනි. ඒ නිසා සමාජානුයෝජනයේදී මව පියා සහ සහෝදරියන්ගෙන් යුත් පවුල ඉතා වැදගත් ආයතනයක් බව පෙන්වා දිය හැකිය.

